දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2025

මගේ අංකය : PD/S/DAPH/AO/EST-43-3

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,

නූපේ,

මාතර.

2026.01. 16

අතිරේක පළාත් අධ්‍යක්ෂ/ විෂය විශේෂඥ
නියෝජ්‍ය අධ්‍යක්ෂ - පළාත් කාර්යාලය/ ගාල්ල/ මාතර/ හම්බන්තොට,
සියලු පශු වෛද්‍ය නිලධාරීන්/ සත්ත්ව පාලන නිලධාරීන්
ස්ථානභාර නිලධාරීන් - සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය,
ස්ථාන භාර නිලධාරී - කැකණදුර ගොවිපොළ.

**දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල වල නිලධාරීන්ගේ රාජකාරී වේලාවන් සංශෝධනය කිරීම.**

උක්ත කරුණට අදාළව පේරාදෙණිය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024.09.20 දිනැති 09/2024 හා 2025.01.01 දිනැති 09/2024 (I) චක්‍රලේඛ සංශෝධන සහිතව දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා මෙම පළාත් චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. උක්ත කරුණ සම්බන්ධයෙන් 2025.01.01 දින නිකුත් කරන ලද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 09/2024 (i) හි අංක 2 හා 3 කරුණු අනුව,

I. රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යාල වේලාව සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2006.05.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2006 ට අනුව රජයේ සේවාවන්ට නියුතු කණිෂ්ට සේවකයන් හැර අනෙකුත් සියළුම සේවකයන්ගේ කාර්යාල වේලාව ( දිවා භෝජනය සඳහා විනාඩි 30 ක කාලය සමඟ) පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා වේ.
II. ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 1:10:2 වගන්තියට අනුව සෙනසුරාදා දින සේවය කරනු ලබන නිලධාරීන් සඳහා, සතියට දින පහමාරක් ($5_{1/2}$) සේවය කළ යුතු යැයි නියම කර ඇති රජයේ නිලධාරීන් ලෙස සඳහන්ව ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්,

03. පශු වෛද්‍ය කාර්යාලවල පශු වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරී වේලාව පහත පරිදි අදාළ කරගත යුතු බව කාරුණිකව දන්වමි.

| පශු වෛද්‍ය කාර්යාලවල පශු වෛද්‍ය නිලධාරීන් | පැමිණීම | පිටවීම |
|---|---|---|
| සතියේ දිනවල | පෙ.ව. 8.30 | ප.ව. 3.30 |
| සෙනසුරාදා දිනවල | පෙ.ව. 8.30 | ප.ව. 12.15 |

04. පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල හා පශු වෛද්‍ය කාර්යාල වල අනෙකුත් නිලධාරීන් හා සේවකයන් සඳහා පහත පරිදි රාජකාරී වේලාවනන් අදාළ වේ.

| පළාත් අධ්‍යක්ෂ කාර්යාලය/ නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල | පැමිණීම | පිටවීම |
|---|---|---|
| පශු වෛද්‍යවරු ඇතුළත්ව සියලු නිලධාරීන් | පෙ.ව. 8.30 | ප.ව. 4.15 |
| කණිෂ්ඨ සේවකයින් | පෙ.ව. 8.00 | ප.ව. 4.45 |
| මුරකරු - දිවා | පෙ.ව. 6.00 | ප.ව. 6.00 |
| මුරකරු - රාත්‍රී | ප.ව. 6.00 | පෙ.ව. 6.00 |

| පශු වෛද්‍ය කාර්යාල - සතියේ දින | පැමිණීම | පිටවීම |
|---|---|---|
| සංවර්ධන නිලධාරීන්, සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් ඇතුළු නිලධාරීන් | පෙ.ව. 8.30 | ප.ව.3.30 |
| කනිෂ්ඨ සේවකයන් | පෙ.ව.8.00 | පෙ.ව.4.00 |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2015 අනුව පශු වෛද්‍ය කාර්යාල වල කණිෂ්ඨ සේවකයන් සඳහා සතියේ දිනවල ප.ව. 3.45 න් පසු රාජකාරී නොපවතී නම් එම නිලධරයන්ට ප.ව. 3.45 ට කාර්යාලයෙන් බැහැරව යාමට ඉඩ දීමට ආයතන ප්‍රධානියාට හැකියාව ඇත.

| පශු වෛද්‍ය කාර්යාල - සෙනසුරාදා | පැමිණීම | පිටවීම |
|---|---|---|
| සංවර්ධන නිලධාරීන්, සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් ඇතුළු නිලධාරීන් | පෙ.ව. 8.30 | ප.ව.12.15 |
| කනිෂ්ඨ සේවකයන් | පෙ.ව.8.00 | පෙ.ව.12.45 |

කේ.එල්.කේ.එස්. පෙරේරා,
පළාත් අධ්‍යක්ෂ (දකුණ)

වෛද්‍ය කේ. එල්. කේ. එස්. පෙරේරා
පළාත් අධ්‍යක්ෂ (දකුණ)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
නූපේ - මාතර.

පිටපත්:

01. ප්‍රධාන ලේකම් - දකුණු පළාත
ංශලේකම් - ධීවර හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය, දකුණු පළාත